# Former Miss Venezuela dies of breast cancer aged 28

# වෙනිසියුලා රූ රැජිණ ඊවා එක්වාල් වයස 28 දී පිළිකාවෙන් මියයයි

## වෙනිසියුලාවෙන් බිහිවූ ප්‍රථම බෞද්ධ රූ රැජිණ ඇයයි !






With her husband and daughter. Pictures show how she lost all her hair after chemotherapy treatments..



The moment she was crowned Miss Venezuela in 2000



Nearing the death, Eva hugs her daughter




**Former Venezuelan beauty queen Eva Ekvall has died from breast cancer aged just 28 on the 17 December 2011.**

Famous in her teenage years for her beauty, Ms Ekvall went on to become a news anchor, author and one of her home country's greatest cancer charity advocates.

She was raised in both the United States and Venezuela and was fluent in English and Spanish from childhood. Born to an American father and Jamaican mother, she was working in a clothes store in Caracas when she was spotted by a modelling agency scout.

" To me that was ridiculous " she told the Guardian earlier this year. " I thought I was overweight. I just couldn't be a model.

" But one day I got fired so I took a cab and went to the modelling agency. Once they saw me … they said they had the next Miss Venezuela right there."

Aged 17, she was crowned Miss Venezuela in 2000. The following year, she was third runner-up in the Miss Universe pageant in Puerto Rico. As a Buddhist, she was the first non - Christian to have won the title of Miss Venezuela.

The journalism graduate became a model, actress and television news anchor for Venevision.

She was diagnosed with advanced breast cancer in February 2010, and underwent eight months of treatment including chemotherapy, radiation and a mastectomy.

" In the beginning I wasn't sure if I looked good or not. Then I realised that wasn't the point. I wasn't supposed to look good, I had cancer "

She had noticed a lump in her breast months earlier but thought her body was changing due to her pregnancy.

" I was very angry because I should have known " she said at the time. " My aunt had breast cancer twice and my grandmother died from breast cancer. And I just let time go."

With honest portraits provided by photographer Roberto Mata, she wrote the book **Fuera de Foco** - translated as **Out of Focus** - to chronicle her struggle with the disease.

She was married to radio producer John Fabio Bermudez and had a two-year-old daughter, Miranda

On 19th Monday, Eva Ekvall's family cremated her remains in Houston near the hospital.

"Sadly, cancer had the last word," writer Leonardo Padron told Globovision. The public of Venezuela are still in a shock sadden by Eva's death.

**2000** වසරේ වෙනිසියුලාවේ රූප රාජිණිය ලෙස අභිෂේක ලැබූ ඊවා එක්වාල් පියයුරු පිළිකාවකින් වයස 28 දී ගිය දෙසැම්බර් 17 වන දින මිය ගියාය. රූමත් කාන්තාවක් මෙන්ම මෝස්තර නිරූපිකාවක්, ලේඛිකාවක් සහ රූපවාහිනී නිවේදිකාවක් වශයෙන් ද ඇය එරටේ ජනතා ආදර ගෞරවයට පාත්‍රව සිටියා ය.

ඇයගේ පියා ඇමරිකානුවකු වන අතර මව ජැමෙයිකාවේය. ඇමරිකාවේත් වෙනසියුලාවේත් ඇති දැඩිවුණු ඇයට ඉංග්‍රීසි ස්පාඤ්ඤ භාෂා දෙකම චතුර ලෙස හැසිරවිය හැකිය. එසේම ඇය ජනමාධ්‍යයෙන් උපාධිධාරිනියකි. ඇය මෝස්තර නිරූපිකාවක් වූයේ අහම්බෙනි. ඒ එවැනි ආයතනයක කෙනෙකු ඇය දැක නිරූපිකාවක් වන්නට කැමතිදැයි ඇසූ බැවිනි. ඒ තැබූ පය ඇය රූරැජිණ දක්වා ඔසවා තැබීය.

වෙනිසියුලාව තද කතෝලික රටකි. එහෙත් ඇය බෞද්ධයෙකි. එරටේ වෙනත් ආගමක කෙනෙක් රූ රැජිණ වූ පළමු අවස්ථාවත් එයයි. ඊට පසු වසරේ ලෝක රූප සුන්දරී තරඟයෙන් ද ඇය තුන්වන තැනට ආවා ය.

පියයුරු පිළිකාවක් ගැන අංශු මාත්‍ර සළකුණක් ඇතිවුණේ 2010 දී ඇය ගැබ්ගත් කාලයේ දී ය. පපුවේ මාංශ පේශියක තරමක ඉදිමුමක් දැනුනත් ඇය සිතුවේ එය ගැබ්ගැනීමේදී වන ස්වාභාවික දෙයක් ලෙසිනි. එහෙත් සැබැවින්ම පිළිකාවකැයි දැනගත් පසු කීමෝ තෙරපි හා එවැනි නොයෙක් ප්‍රතිකාර ගන්නට සිදු විය. බලා සිටියදීම ඇගේ ලස්සන කෙස් කළඹ හැලී ගියේය. මුලදී කම්පා වුවද පසුව ඇය ජීවිතයේ අනියත බව හා පිළිකාවක ස්වභාවය තේරුම් ගත්තා ය.

ඊවාගේ පුංචි අම්මාට පියයුරු පිළිකාවක් සෑදී තිබුණි. ඇගේ ආත්තම්මා ද මියගොස් තිබුණේ එවැනි පිළිකාවකිනි. තමා මුලින් පරීක්ෂාකාරී නොවීම ගැන ඇය තුළ ඇත්තේ පසුතැවිල්ලකි.

රේඩියෝ වැඩසටහන් නිශ්පාදකවරයෙකු හා විවාහ වී සිටින ඊවාට මිරැන්ඩා නමින් දෙහැවිරිදි දියණියකි තම ලෙඩේ කොතෙක් අසාධ්‍ය වුවත් ඒ දියණිය මහත් සැනසිල්ලකැයි ඇය කීවා ය.

පවුලේ අය ඇගේ අවසන් කටයුතු හුස්ටන් හිදී නිමකර ඇත. වෙනිසියුලාවේ ජනතාව ඊවා එක්වාල්ගේ අකල් මරණයෙන් කම්පාවී සිටිති. ජීවිතය යනු පිනි බිඳුවක් බව සැබෑවක් නොවේද ?

## Who would you invite for dinner and why?

As a Buddhist, Eva Ekvaal was the first non-Christian to have won the title of Miss Venezuela.

Popular American singer Marc Anthony once on a TV discussion asked Eva Ekvall this question: " If you can invite one famous person, living or dead, to a dinner party, who would it be and why ? "

**Eva Ekvall replied :** " It would definitely be the **Dalai Lama** because first of all, my father is a Buddhist and I've learned a lot of Buddhism practices through him. And as a matter of fact, today, I am a Buddhist. And I would like to know a lot about how he keeps his eternal peace which is so incredible and to teach the whole world that obviously."

**ජ**නප්‍රිය ඇමරිකානු ගායක මාක් ඇන්තනි, රූ රැජිණ තරඟයට පසුව පැවති ටෙලිවිෂන් සාකච්ඡාවකදී ඊවා එක්වාල්ගෙන් මේ ප්‍රශ්නය ඇසීය :

" භෝජන සංග්‍රහයකට කෙනෙකුට ආරාධනා කරන්නට ඔබට සිදුවුවහොත් ඔබ නිසැකවම ආරාධනා කරන්නේ කාටද? ඇයි ඔහුට ආරාධනා කරන්නෙ කියලත් මට කියන්න."

**ඊවාගේ පිළිතුර :** " නිසැකවම ඒ පුද්ගලයා තමයි දළයි ලාමා. මගේ පියා බෞද්ධයෙක්. බෞද්ධ වත් පිළිවෙත් හා පිළිපැදීම් මම උගත්තෙ පියාගෙන්. අද මමත් බෞද්ධයෙක්. මම විශේෂයෙන් දැනගන්න කැමතියි දළයි ලාමා තුමා හැම විටම ඔහුගේ හිතේ ඒ අපූර්ව සන්සුන්කම, එකමිතිය ලෝකයාටත් කියා දෙමින් කොහොමද නොකැඩී පවත්වාගෙන යන්නෙ කියලා."

♦ **වෙනුර Venura**